ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

**ආචාර්ය නන්දික සනත් කුමානායක මහතා නව ජනාධිපති ලේකම් ලෙස දිවුරුම් දෙයි**

නව ජනාධිපති ලේකම් ලෙස ආචාර්ය නන්දික සනත් කුමානායක මහතා අද (23) පෙරවරුවේ ජනාධිපති කාර්යාලයේ දී ජනාධිපති අනුර කුමාර දිසානායක මහතා ඉදිරියේ දිවුරුම් දුන්නේය.

කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යාවේදී ගෞරව උපාධිය ලබාගත් කුමානායක මහතා ජපානයේ National Graduate Institute for Policy Studies (GRIPS) වෙතින් සංවර්ධන ආර්ථික විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධියක් සහ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සහ රාජ්‍ය ආර්ථික විද්‍යාව (Public Economics) පිළිබඳ ශාස්ත්‍රපති උපාධි ලබා ගෙන ඇත.

ආචාර්ය කුමනායක මහතා රේගු දූෂණ පිළිබඳ පර්යේෂණ සිදු කර ඇති අතර එම පර්යේෂණ ජාත්‍යන්තර ප්‍රකාශන ගණනාවක ප්‍රකාශයට පත් කර ඇත.

ඔහු ලෝක රේගු සංවිධානය (World Customs Organaisation) රේගු නවීකරණය සහ සුපිලිපන්න භාවය වර්ධනය කිරීම පිළිබඳ වරලත් උපදේශකයෙකි.

1997 වසරේ රේගු නිලධාරියෙකු ලෙස සේවයට බැඳුනු කුමානායක මහතා ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කරන ලදී.

ඔහු මාතර රාහුල විද්‍යාලයේ ආදි ශිෂ්‍යයෙකි.

ජනාධිපති මාධ්‍ය අංශය
2024-09-23